| 09 | S | I |
|---|---|---|

# දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 8
# DEVI BALIKA VIDYALAYA – COLOMBO 8

ප්‍රථම වාර පරීක්ෂණය - 2022 මැයි

ජීව විද්‍යාව I

12 ශ්‍රේණිය

කාලය :- පැය 01 යි

- සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- 1-25 දක්වා වූ ප්‍රශ්ණ සඳහා (1,2,3,4,5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් යොදා දක්වන්න.

(01) ජීවීන් සතු ලාක්ෂණික ලක්ෂණ සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1) අප්‍රතිවර්ත්‍ය ලෙස සිදුවන වියළි ස්කන්ධයෙහි වැඩිවීම දැකිය හැක්කේ ජීවීන් තුල පමණි.
2) විශේෂයක අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම සඳහා නව ජනිතයින් බිහිකිරීම ප්‍රජනනයේදී සිදුවේ.
3) වර්ධනය සහ විකසනය ජීවියෙකුගේ ජීවිත කාලය තුල සිදුවන අනුගාමී ක්‍රියාවලි දෙකකි.
4) පහළ මට්ටම්වල සංරචක , ඉහළ මට්ටම්වලදී ක්‍රමවත් රටාවකට සංවිධානය වීම සඳහා ශක්තිය අවශ්‍ය වේ.
5) ජීවීන් සතු ජාන එක් පරම්පරාවක සිට අනෙක් පරම්පරාවට ගමන් කරනු ලබන්නේ පරිනාමය මගිනි.

(02) ජලය පිළිබඳව පහත සඳහන් කවරක් සත්‍ය වේද ?

1) ජලය ද්‍රව අවස්ථාවේ ඇති විට එහි ඇති හයිඩ්‍රජන් බන්ධන වඩාත් ශක්තිමත් වේ.
2) ජලයට අධික පෘෂ්ඨීක ආතතියක් ඇති බැවින් කුඩා කෘමීන්ට ජල පෘෂ්ඨය මත ඇවිදීමට හැකිය.
3) ජලයට අධික වාෂ්පීකරණයේ ගුප්ත තාපයක් ඇති නිසා අවම ජල හානියක් සිදුකර අවම තාප ශක්තියක් නිදහස් කළ හැකිය.
4) ජලයට උපරිම ඝනත්වයක් ඇත්තේ 0°C දී බැවින් අයිස් ජල පෘෂ්ඨය මත පාවේ.
5) ජල අණු සහ සෛල බිත්ති අතර ඇති සංසක්ති බල හේතුවෙන් සෛලම තුලින් ජලය පරිවහනය වේ.

(03) පෙන්ටෝස අඩංගු සංඝටකයක් වන්නේ පහත කවරක්ද ?

1) හෙමිසෙලියුලෝස්  2) පෙක්ටින්  3) සුක්‍රෝස්  4) ඉනියුලින්  5) ලැක්ටෝස්

(04) සියලුම ආකාරයේ ලිපිඩ සඳහා පොදු ලක්ෂණයක් වන්නේ,

1) ඒවා මේද අම්ල සහ ග්ලිසරෝල් වලින් සෑදී තිබීම.
2) ඒවා ජෛවීය මහා අණු වීම.
3) සියල්ල ජල භීතික අණු වීම.
4) සංචිත කෘත්‍යයක් ඉටු කිරීම.
5) H : O අනුපාතය 1 : 2 වීම.

(05) සියලු ඇමයිනෝ අම්ල,

1) වල අසමමිතික කාබන් පරමාණුවක් ඇත.
2) උභයගුණී වේ.
3) වල පැති දාමය දිගු හයිඩ්‍රොකාබන දාමයකි.
4) සංයුතියේ C,H,O,N සහ S අඩංගු වේ.
5) පෙප්ටයිඩ බන්ධන සහිතය.

(06) කාබෝහයිඩ්‍රේට සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරින් කවරක් නිවැරදිද ?

1) ප්ලෝයම් තුළ පරිවහනය වන ප්‍රධාන කාබෝහයිඩ්‍රේටය - මොනොසැකරයිඩ
2) ශාකවල ප්‍රධාන සංචිත කාබෝහයිඩ්‍රේට - ඩයිසැකරයිඩ
3) දිලීරවල ප්‍රධාන සංචිත ප්‍රභවය - පොලිසැකරයිඩ
4) බැක්ටීරියා සෛල බිත්තිවල ප්‍රධාන ව්‍යුහමය සංඝටකය - ඩයිසැකරයිඩ
5) ඇල්ගී ආකන්ධවල ප්‍රධාන සංචිත ප්‍රභවය - මොනොසැකරයිඩ

.22 A/L අපි [papers grp].
Scanned with CamScanner

(07) තනි නියුක්ලියෝටයිඩයකින් සෑදී ඇති සංඝටකයක් වන්නේ,

1) RNA   2) NAD+   3) NADP   4) ATP   5) FAD

(08) ප්‍රෝටීන අඩංගු ද්‍රාවණයට ක්ෂාරීය $CuSO_4$ දැමූවිට දම්-නිල් වීමෙන් හඳුනාගැනෙන්නේ එහි,

1) පෙප්ටයිඩ බන්ධන ඇතිබව
2) අයනික බන්ධන ඇතිබව
3) හයිඩ්‍රජන් බන්ධන ඇතිබව
4) ඩයි සල්ෆයිඩ් බන්ධන ඇතිබව
5) ඇමයිනෝ අම්ල ඇතිබව

22 A/L අපි [ pap

(09) DNA පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) එක් එක් දාමයේ A+T / C+G අනුපාතය 1 : 0 වේ.
2) අණුවේ ඇඩිනින් ප්‍රමාණය 24% නම්, ගුවනින් ප්‍රමාණය ද 24% කි.
3) සෛල චක්‍රයේ DNA ප්‍රතිවලිතය සිදුවන්නේ $G_1$ හා $G_2$ කලා අතරදීය.
4) පොලිනියුක්ලියෝටයිඩ දාමයේ පොස්පොඩයිඑස්ටර බන්ධන සැදෙන්නේ යාබද නියුක්ලියෝටයිඩ වල 3 වන කාබන් පරමාණු අතරය.
5) ප්‍රාග් න්‍යෂ්ටික සෛල තුල DNA ප්‍රතිවලිතය සිදු නොවේ.

(10) RNA සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1) සූ න්‍යෂ්ටික සෛලයක න්‍යෂ්ටියේ සංස්ලේෂණය වේ.
2) රයිබසෝම වල ව්‍යුහගත සංඝටක ලෙස ඇත.
3) තනි නියුක්ලියෝටයිඩ දාමයක් තනි හෙලික්සයක් ලෙසට පවතී.
4) ඇතැම් වයිරසවල අවේනික ද්‍රව්‍ය ලෙස ක්‍රියාකරයි.
5) ප්‍රෝටීන සංස්ලේෂණයේදී වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

(11) පහත සඳහන් සෛලීය සංඝටක අතුරින් ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ නොහැක්කේ,
1) මයිටකොන්ඩ්‍රියා   2) සෛල ප්ලාස්ම පටල   3) හරිතලව   4) න්‍යෂ්ටිය
5) සෛල බිත්තිය

(12) ප්ලාස්ම පටලයේ ඇති ප්‍රෝටීන පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) පටලයේ ගිලී ඇති ප්‍රෝටීන මගින් සෛල එකිනෙක සන්නිවේදනය කරයි.
2) සියලුම සම්පූරක ප්‍රෝටීන වලට පටලය හරහා විනිවිද යා හැකිය.
3) ප්ලාස්ම පටලයට ලිහිල්ව බැඳී ගිලුණු ප්‍රෝටීන පර්යන්ත ප්‍රෝටීන වේ.
4) සම්පූරක ප්‍රෝටීන සියල්ල ජලකාමී නාලිකා සහිතයි.
5) තිර්යක් පටල ප්‍රෝටීනවල ජලකාමී නාලිකා ඔස්සේ ඕනෑම ධ්‍රැවීය අණුවකට ගමන් කළ හැකිය.

(13) පහත සඳහන් කවර කෘත්‍යයක් රළු අන්තඃ ප්ලාස්මීය ජාලිකා සහ සිනිඳු අන්තඃ ප්ලාස්මීය ජාලිකා ඉන්ද්‍රියිකා දෙකම සඳහා සත්‍ය ද ?
1) ග්ලයිකොප්‍රෝටීන සංස්ලේෂණය
2) කාබෝහයිඩ්‍රේට සංස්ලේෂණය
3) පොස්පොලිපිඩ සහ ප්‍රෝටීන එක්කරමින් පටල වර්ධනය පහසු කිරීම.
4) පරිවහන ආශයිකා නිපදවීම.
5) විෂ හරණයට දායක වීම.

(14) සත්ත්ව සෛලයක ක්ෂුද්‍ර නාලිකා පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,
1) එහි බිත්තිය ටියුබියුලින් ප්‍රෝටීන ස්ථම්භ නවයකින් සෑදී ඇත.
2) ඒවා සියලුම ජීවීන්ගේ පක්ෂ්ම / කශිකා වල ව්‍යුහ සෑදීමට දායක වේ.
3) ඒවා ශාඛනය වූ කුහරමය ව්‍යුහ වේ.
4) ශාක සෛල විභාජනයේදී තර්කුව සෑදීමට දායක වේ.
5) සෛල ප්ලාස්ම විභාජනයේදී සෛල තලය සෑදීමට දායක වේ.



Scanned with CamScanner

(15) සත්ත්ව සෛලයක අනුනන විභාජනයේ පෙර යෝග කලාවේදී සිදුවන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කවරක්ද ?

1) අනුනන තර්කුව සෑදීම ආරම්භ වීම.
2) කේන්ද්‍රදේහ සෛලයේ ප්‍රතිවිරුද්ධ ධ්‍රැව දෙසට චලනය වේ.
3) වර්ණදේහ සෛලයේ මධ්‍යයේ පෙළ ගැසීම.
4) න්‍යෂ්ටි පටලය බිඳී යාම.
5) න්‍යෂ්ටිකාව නොපෙනී යාම.

22 A/L අපි [ papers grp

(16) සෛලයක විභාජන අවස්ථාවක් පහත රූපයේ දැක්වේ.



මෙම විභාජන අවධිය සම්බන්ධ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

(a) මෙම විභාජනයෙන් ඇතිවන දුහිතෘ සෛල ද්විගුණ වේ.
(b) එය සපුෂ්ප ශාක සෛලයක් විය හැක.
(c) ඉහත සෛලය ද්විගුණ සෛලයක් විය හැක.
(d) එය ඌනන විභාජනයේ අවස්ථාවක් විය හැක.
මින් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) a හා b  2) b හා c  3) c හා d  4) a හා c  5) b හා d

(17) සෛල විභාජනය හා සම්බන්ධ පහත වගන්ති අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) ඌනන විභාජනයේදී ප්‍රතිඵල වන දුහිතෘ සෛල ප්‍රවේණිකව සර්වසම නොවේ.
2) අනුනන විභාජනයේදී සමජාත වර්ණදේහ යුගලනය වේ.
3) ඌනන විභාජනයේදී ප්‍රතිඵල වන දුහිතෘ න්‍යෂ්ටි මාතෘ න්‍යෂ්ටියට ප්‍රවේනිකව සර්වසම වේ.
4) අනුනන විභාජනයේදී සිදුවන ප්‍රතිසංයෝජන හේතුවෙන් ප්‍රවේනික ප්‍රභේදන ඇති වේ.
5) ශාක දේහයේ සියලුම පටක , අනුනන විභජනය මගින් නව සෛල නිපදවයි.

(18) පිළිකා හා ගඩු සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය වනුයේ,

1) පිළිකා සෛල , දේහයේ පාලන යාන්ත්‍රණ වලට ප්‍රතිචාර දක්වයි.
2) පිළිකා සෛල වලටද වර්ධක සාධක අවශ්‍යයි.
3) අසාමාන්‍ය සෛල මුල් ස්ථානය තුලම රැඳී ඇතිවන ඉදිමුම සෝපද්‍ර අර්බුදයයි.
4) ශාක සෛලවල පාලනය කළ හැකි අනුනන විභජනය නිසා ගඩු ඇති වේ.
5) පිළිකා සෛල , වර්ධක සාධක රහිතව සෛල චක්‍රය ඉදිරියට ගෙන යාමට සංඥා ලබාදේ.

(19) එන්සයිම පිලිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,
1) සජීවී සෛල තුල පමණක් ක්‍රියා කරයි.
2) සජීවී ඕනෑම සෛලයක නිපදවෙයි.
3) නිපදවෙන සෛල තුල පමණක් ක්‍රියා කරයි.
4) ශාක හා සතුන්ගේ වෙනස් වූ ලක්ෂණ සහිතයි.
5) බයියුරේට් පරීක්ෂාවට පිළිතුරු නොදෙයි.

(20) ATP පිළිබඳව සත්‍ය වන්නේ,
1) පොලි නියුක්ලියෝටයිඩයකි.
2) පොස්පේට කාණ්ඩ දෙකක් පමණක් දරයි.
3) අධිශක්ති බන්ධන තුනක් පවතී.
4) ඉලෙක්ට්‍රෝන වාහකයෙකි.
5) සචල අණුවකි.


Scanned with CamScanner

21 සිට 25 දක්වා ප්‍රශ්ණ වලදී දී ඇති ප්‍රතිචාර වලින් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි වේ. කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදි ද යන්න පළමුව විනිශ්චය කරන්න.
පසුව පිළිතුර සඳහා නිවැරදි අංකය තෝරන්න.

A,B,D යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ. ............................................ 1
A,C,D යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ. ............................................ 2
A හා B යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ. ............................................ 3
C හා D යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ. ............................................ 4
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් නිවැරදි වේ. ............ 5

| උපදෙස් සැකවිත් | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A,B,D නිවැරදිය | A,C,D නිවැරදිය | A හා B නිවැරදිය | C හා D නිවැරදිය | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් / ප්‍රතිචාර නිවැරදිය |

(21) ජෛවීය අණු සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ/යක් සත්‍ය වේද ?
A. සියළුම කාබෝහයිඩ්‍රේට මහා අණු වේ.
B. ප්‍රෝටීන දූස්වභාවීකරණයේදී එහි ඇති සියලුම බන්ධන බිඳ වැටේ.
C. ජීවීන්ගේ ප්‍රවේණික ද්‍රව්‍ය වල කාබෝහයිඩ්‍රේට අඩංගු වේ.
D. ප්‍රෝටීන හා නියුක්ලෙයික් අම්ල ශාඛනය නොවූ දාම සහිත බහුඅවයවීක වේ.
E. ට්‍රයි ඒසයිල් ග්ලිසරෝල් අණුවක් සෑදීමට මේද අම්ල අණුවක් හා ග්ලිසරෝල් අණු තුනක් සහභාගී වේ.

(22) ප්‍රෝටීන , කාබෝහයිඩ්‍රේට හා ලිපිඩ සියල්ල,
A. සෛල පටල වල අත්‍යාවශ්‍ය ව්‍යුහගත සංඝටක වෙයි.
B. බහු අවයවීක කාබනික සංයෝග වේ.
C. C H O අන්තර්ගත කාබනික සංයෝග වේ.
D. සෛල බිත්ති වල අත්‍යාවශ්‍ය ව්‍යුහ සංඝටක වේ.
E. බෙනඩික් ද්‍රාවණය සමග ගඩොල් රතු අවක්ෂේපයක් ලැබේ.

(23) මයිටකොන්ඩ්‍රියා මෙන්ම හරිතලව යන ඉන්ද්‍රියිකාවල ඇති පොදු සංඝටක/ය වනුයේ,
A. 70 S රයිබසෝම
B. චක්‍රීය DNA
C. පිෂ්ඨ කණිකා
D. එන්සයිම
E. පොස්පේට් කණිකා

(24) සෛල චක්‍රය සම්බන්ධයෙන් දී ඇති පහත ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශ / ය තෝරන්න.
A. අන්තර්කලාව සෛල විභාජනයේ දීර්ඝතම කලාවයි.
B. ප්‍රථම පරතර කලාවේදී, DNA සංස්ලේෂණය සිදුවේ.
C. දෙවන පරතර කලාවේදී, ප්‍රෝටීන සංස්ලේෂණය සිදුවේ.
D. හිස්ටෝන ප්‍රෝටීන සංස්ලේෂණය , S කලාවේදී සිදුවේ.
E. සෛල ඉන්ද්‍රියිකා නිපදවීම සංස්ලේෂණ කලාවේදී සිදුවේ.

(25) එන්සයිම ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.
A. සෛල පටල හරහා ගමන් කළ නොහැක.
B. ඇතැම් ඒවායේ ක්‍රියාකාරීත්වයට ලෝහ යන අවශ්‍ය වේ.
C. ඇතැම් ලෝහ අයන මගින් අක්‍රිය කළ හැක.
D. ප්‍රතික්‍රියාව සඳහා සුළු ප්‍රමාණයක් තිබීම සෑහේ.
E. ප්‍රතික්‍රියාවේදී විනාශ වී යයි.


Scanned with CamScanner

## A කොටස - ව්‍යුහගත රචනා

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) A)

I) a) ජීවීන් සතු ලාක්ෂණික ලක්ෂණයකි අනුවර්තනය. අනුවර්තනය යන්නෙන් කුමක් අදහස් වේද ?

.....................................................................................................

.....................................................................................................

b) ශුෂ්ක පරිසරවලට ශාක දක්වන අනුවර්තනයක් සඳහන් කරන්න.

.....................................................................................................

II) පහත දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද යොදන්න.

a) පෘතුවියේ මුලින්ම ඇතිවූ ජීවීහු විෂමපෝෂී ප්‍රාග් න්‍යෂ්ටිකයෝ වූහ. (     )

b) වර්තමාන ලෝකයේ අනතුරුදායක බෝවන රෝගයකි දියවැඩියාව. (     )

c) උද්දීප්‍යතාවයේ සහ සමායෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ජීවීන්ගේ චලන සිදුවේ. (     )

III) පහත සඳහන් කෘත්‍යයන්ට අදාලව ජලයේ ප්‍රධාන ගුණය සඳහන් කරන්න.

a) ක්ෂීරපායින්ට දේහ උෂ්ණත්වය නියතව තබා ගත හැකිවීම ..........................................

b) උස ශාකයක සෛලම ඔස්සේ ජලය හා ඛනිජ පරිවහනය ..........................................

IV) ග්ලූකෝස් වලින් සමන්විත ශාකවල පමණක් දක්නට ලැබෙන බහුඅවයවීක දෙකක් නම් කරන්න.

........................................ ........................................

.22 A/L අභි [ papers grp ].

V) නයිට්‍රජන් අඩංගු පොලිසැකරයිඩයක් නම් කර එය හමුවන ස්ථානයක් සඳහන් කරන්න.

පොලිසැකරයිඩය ස්ථානය

........................................ ........................................

VI) විද්‍යාගාරයේදී නිර් ඔක්සිහාරක සීනි හඳුනාගැනීමේ පරීක්ෂණයේදී සිදුකරන ලබන පහත පියවරවල අරමුණ සඳහන් කරන්න.

අරමුණ

a) තනුක HCL යෙදීම ..........................................

b) NaOH / $NaHCO_3$ යෙදීම ..........................................

B)

I)




ඉහත දැක්වෙන අණුවෙහි B හා C කොටස්වල අඩංගු විය හැකි එකිනෙකට වෙනස් සංයෝග නම් කරන්න.

B :- ..........................................................................................

C :- ..........................................................................................



Scanned with CamScanner

II) ඉහත අණුවෙහි A , B හා C සංඝටක එකිනෙකට සම්බන්ධ වන ආකාරය සඳහන් කරන්න.

........................................................................................................................

........................................................................................................................

III) නියුක්ලෙයික් අම්ලවල තිබිය හැකි නියුක්ලියෝටයිඩ වර්ග සංඛ්‍යාව කොපමණද ?

........................................................................................................................

IV) අනුපූරක භෂ්ම යුගල් විමක් ( පුඩු ) සහිත RNA වර්ගය නම් කර එහි කෘත්‍යය සඳහන් කරන්න.

RNA වර්ගය ........................................ කෘත්‍යය ........................................

V) සෛල තුළ අඩංගු ( මහා අණු නොවන ) වෙනත් නියුක්ලියෝටයිඩ දෙකක් නම්කර ඒවායේ කෘත්‍යය සඳහන් කරන්න.

නියුක්ලියෝටයිඩ ........................................ කෘත්‍යය ........................................

.22 A/L අපි [ papers grp ].

........................................ ........................................

C) I) සෛල පටලවල අඩංගු එකිනෙකට වෙනස් ලිපිඩ වර්ග දෙකක් සඳහන් කරන්න.

........................................................................................................................

II) ට්‍රයිඑසයිල්ග්ලිසරෝල් අණුවක් සෑදීමට අවශ්‍යය සංඝටක නම් කරන්න.

........................................................................................................................

III) පෙප්ටයිඩ බන්ධන හැර ප්‍රෝටීනයක තෘතියික ව්‍යුහයේ ස්ථායිතාව පවත්වා ගැනීමට වැදගත් වන බන්ධන වර්ග 2ක් නම් කරන්න.

........................................................................................................................

IV) පරිවාහක කෘත්‍යයක් ඉටුකරන ප්‍රෝටීන වර්ග දෙකක් නම් කර ඒවා මගින් පරිවහනය කරනු ලබන ද්‍රව්‍යයක් බැගින් සඳහන් කරන්න.

පරිවාහක ප්‍රෝටීනය ........................................ පරිවහනය වන ද්‍රව්‍ය ........................................

........................................ ........................................

V) a) ප්‍රෝටීන දුස්ස්වාභාවිකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද ?

........................................................................................................................

........................................................................................................................

b) ප්‍රෝටීන දුස්ස්වභාවිකරණයට බලපාන සාධක දෙකක් නම් කරන්න.

........................................ ........................................

VI) සෛල තුළ ප්‍රෝටීන සංස්ලේෂණය ඉටු කරන ඉන්ද්‍රයිකාව නම් කරන්න.

........................................................................................................................



Scanned with CamScanner

(02) A)

I) ප්‍රාග් න්‍යෂ්ටික සංවිධානය සහිත ජීවී කාණ්ඩ නම් කරන්න.

.....................................................................................................

.....................................................................................................

II) සමහර ප්‍රාග් න්‍යෂ්ටිකයන් පමණක් පෙන්වන කායික විද්‍යාත්මක ලක්ෂණය කුමක්ද ?

.....................................................................................................

III) a) ප්‍රාග් න්‍යෂ්ටික හා සූ න්‍යෂ්ටික සංවිධාන දෙකෙහිම හමුවන උපසෛලීය ව්‍යුහය නම් කරන්න.

.....................................................................................................

b) සෛල සැකිල්ලේ කෘත්‍යයන් දෙකක් ලියන්න.

.22 A/L අපි [ papers grp ].

.....................................................................................................

.....................................................................................................

IV) සෛල සන්ධි යනු කුමක්ද ?

.....................................................................................................

.....................................................................................................

V) සත්ත්ව සෛල වල දක්නට ලැබෙන සෛල සන්ධි වර්ග තුනක් සඳහන් කර එක් එක් සන්ධියේ එක් කෘත්‍යයක් බැගින් ලියා දක්වන්න.

| සන්ධි වර්ගය | කෘත්‍යය |
| --- | --- |
| ........................................ | ................................................................ |
| ........................................ | ................................................................ |
| ........................................ | ................................................................ |

VI) ශාක සෛලවල ප්ලාස්ම බන්ධ වල කෘත්‍යයට සමාන කෘත්‍යයක් ඉටු කරන සත්ව සෛලවල සන්ධිය නම් කරන්න.

.....................................................................................................

Scanned with CamScanner

B)




I) රූපයේ දැක්වෙන ආලෝක අන්වීක්ෂයේ පහත කොටස් නම් කරන්න.

A ........................................ B ........................................

C ........................................ D ........................................

II) සංයුක්ත අන්වීක්ෂය භාවිතයෙන් නිදර්ශකයක සමස්ත විශාලනය ලබාගන්නේ කෙසේද ?

..........................................................................................................................................

III) a) අන්වීක්ෂයක විභේදන බලය යනු කුමක්ද ?

..........................................................................................................................................

..........................................................................................................................................

.22 A/L අභි [ papers grp ].

b) අන්වීක්ෂයක විභේදන බලය සීමා වන්නේ කවර සාධකයක් මතද ?

..........................................................................................................................................

IV) වීදුරු කදාවක් මත තැංවා ඇති වැණු අපිවර්මීය සිවියක් අලෝක අන්වීක්ෂයෙන් පරීක්ෂා කිරීමේදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙල සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

V) සම්ප්‍රේෂණ ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයෙන් සහ පරිලෝකන ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කෙරෙන ප්‍රතිබිම්බවල ප්‍රධාන වෙනස්කම් කුමක්ද ?

..........................................................................................................................................

..........................................................................................................................................



Scanned with CamScanner

C) I) සත්ත්ව සෛල වල බහිස්සෛලීය පූරකයේ ඇති ප්‍රධාන සංඝටක දෙකක් නම් කරන්න.

.....................................................................................................................................

II) සත්ත්ව සෛලවල බහිස්සෛලීය පූරකයේ කෘත්‍යයන් දෙකක් සඳහන් කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

III) ශාක සෛලවල ද්විතියික සෛල බිත්තියේ පමණක් අඩංගු රසායනික සංඝටක දෙකක් නම් කරන්න.

.....................................................................................................................................

IV) එන්සයිම ප්‍රතික්‍රියාවක වේගය කෙරෙහි උෂ්ණත්වයේ බලපෑම පෙන්වීමට ප්‍රස්තාරයක් අඳින්න.

.22 A/L අපි [ papers grp ].

V) ප්‍රශස්ත උෂ්ණත්වය දක්වා ප්‍රතික්‍රියා වේගය වෙනස් වීම කෙසේ සිදුවේදැයි කෙටියෙන් පහදන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

VI) a) එන්සයිම සහසාධක යන්නෙන් අදහස් වන්නේ මොනවාද ?

.....................................................................................................................................

b) එන්සයිම සහසාධක ලෙසට ක්‍රියාකරන විටමිනයක් නම් කරන්න.

.....................................................................................................................................

## B කොටස - රචනා

(01) කෙටි සටහන් ලියන්න.

a) උෂ්නනය ප්‍රාක් කලාව I

b) නියුක්ලියෝටයිඩ

c) එන්සයිම නිශේධක

(02)(a) හරිතලවයක ව්‍යුහය විස්තර කරන්න
ප්‍රභාසංශ්ලේෂණය යනු කුමක්දැයි හැඳින්වීම කර [illegible]
[illegible] ප්‍රකාරය
[illegible] විස්තර [illegible]

PAST PAPERS WIKI



Scanned with CamScanner